ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

2012 අප්‍රේල් මස 09 වන දින

මගේ අංකය : PCMD/3/9

ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා මෙහෙයුම්

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,

"මහින්ද චින්තන ඉදිරි දැක්ම"

පස් අවුරුදු උපාය මාර්ගික සංවර්ධන ප්‍රවේශය - කාර්තුමය ප්‍රගති සමාලෝචනය

මගේ අංක CS/1/AD දරණ 2012.03.14 දිනැති ලිපියට ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ඒ අනුව "මහින්ද චින්තන ඉදිරි දැක්ම" (2011-2016) උපාය මාර්ගික සංවර්ධන ප්‍රවේශයට අනුකූලව ඒ ඒ අමාත්‍යාංශය විසින් 2012 වසර සඳහා යෝජනා කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සියලුම අමාත්‍යාංශ ක්ෂේත්‍ර කීපයකට වර්ගීකරණය කර ප්‍රගති සමාලෝචන රැස්වීම් මාලාවක් පැවැත්වීමට මා විසින් අදහස් කර ඇති අතර, මේ වන විට 2012 වර්ෂයේ ප්‍රථම කාර්තුවට අදාලව රාජ්‍ය පරිපාලන, මානව සම්පත් සංවර්ධන සහ සෞඛ්‍ය හා සමාජ සේවා යන ක්ෂේත්‍රයන්හි ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අවසන් කොට ඇත.

ඒ අනුව ඉදිරි වසර තුල එක් එක් අමාත්‍යාංශය මගින් අත්කර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය අවම වශයෙන් ප්‍රධාන කාර්ය සාධන ඇගයීම් දර්ශක (Key Performance Measurement Indicators) 5 ක් යටතට ගෙන සැකසීමට එක් එක් අමාත්‍යාංශය මගින් වහාම වැඩ පිළිවෙලක් දියත්කල කළ යුතු අතර, ඒ සඳහා ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය මෙන්ම රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් අවශ්‍ය උපදේශණ/නියාමන දායකත්වය ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

මේ සමඟ අමුණා ඇති ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතන වෙත ලබා දී ඇති ඉලක්ක වෙත ළඟා වීමේ ක්‍රමෝපායයන් ඇතුලත් පස් අවුරුදු සංයුක්ත සැලැස්මක් ( **Corporate plan** ) ඉදිරි තෙමස තුල සකස් කිරීමට කටයුතු කර 2012-2016 වර්ෂවලට අදාලව එක් එක් කාර්තු තුළ ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන ඉලක්ක හා ඒ සඳහා ගනු ලබන ක්‍රියාකාරකම්ද, කාර්ය සාධන ඇගයීම් දර්ශකද ඇතුලත් වන එම වාර්තාවේ කෙටුම්පතක් දෙවන කාර්තුවේදී පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඔබ වෙත දන්වා සිටිමි.

ඔබ අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන, අමුණා ඇති මහින්ද චින්තන ප්‍රතිපත්ති / ඉලක්ක ලඟාකර ගැනීම උදෙසා ඔබගේ පෞද්ගලික සභාපතිත්වයෙන් යුතුව ඔබ යටතේ සේවය කරන්නා වූ සියලුම ආයතන ප්‍රධානීන් හා මාණ්ඩලික නිළධාරීන් සමඟ පවත්වනු ලබන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තාවන්හි පිටපතක්ද එළඹෙන මාසයේ 10වන දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබීමට සලස්වන මෙන්ද කාරුණිකව ඉල්ලා සිටිමි.

අත්/කලේ : ලලිත් වීරතුංග
ජනාධිපති ලේකම්

අනුර දිසානායක
ජනාධිපති අතිරේක ලේකම්
(ප්‍රතිපත්ති සම්බන්ධීකරණ හා මෙහෙයුම්)

පිටපත්:

ලේකම්/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලය - සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් සකස් කිරීම පිණිස

ලේකම්, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය -
ලේකම්, රාජ්‍ය කලමනාකරණ හා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය -
} උපදෙස් ප්‍රකාරව කාර්ය සාධන දර්ශක ආශ්‍රිතව ක්‍රියාකාරී සැලසුම් එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් සකස් කර නියාමනය කිරීම පිණිස

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු - පළාතට අදාල 2012-2016 සංවර්ධන ඉලක්ක ආශ්‍රිත සැලසුම් සකස්කර ඉදිරිපත් කිරීම පිණිස

සභාපති, මුදල් කොමිෂන් සභාව - පළාත් සභා සැලසුම් / කාර්ය සාධන දර්ශක නියාමනය සඳහා වූ යාන්ත්‍රණයක් සකස්කර ඉදිරිපත් කිරීම පිණිස